# කල්ප විනාශය අභියස?

**අශෝක අභයගුණවර්ධන**

**බලශක්ති සංසදය,**

441/6, හයිලෙවල් පාර, ගංගොඩවිල නුගේගොඩ

Tel:  94 11 5524613; 11 2817710 Fax: 94 11 5532188 Email: eforum@sltnet.lk

මේ මිහිතලය මත දැන් ජීවත්වන ජනගහනය කෝටි 670 ඉක්මවා ඇත. මීට වසර 150කට පෙර මෙලොව ජීවත්වූයේ මිනිසුන් කෝටි 126 ක් පමණි. එනම් පසුගිය අවුරුදු 150 තුළ මෙලොව ජීවත්වන ජනගහනය 5 ගුණයකින් පමණ ඉහළ ගොස් ඇත. අනෙක් අතට එක පුද්ගලයකු සිය පැවැත්ම සඳහා පරිභෝජනය කරන සම්පත් ප්‍රමාණය ද ඉහළ ගොස් ඇත. මිනිසකු භාවිතා කරන බලශක්තිය ගැන විමසා බැලූ විට පෙනියන්නේ ඒක පුද්ගල බලශක්ති පරිභෝජනය කාර්මික විප්ලවයට පෙර කාලයේ භාවිතා කළ ප්‍රමාණයට වඩා 8 ගුණයකින් පමණ ඉහළ ගොස් ඇති බවයි. මේ අනුව මිහිතලයට සැබැවින්ම දැනෙන්නේ මෙලොව දැන් ජීවත්වන්නේ කෝටි 670 ලෙස නොව කෝටි 5000ක් ලෙසයි. මෙවන් ජනගහනයක් මේ මිහිතලය තුළ නඩත්තු කිරීමට හැකි වී ඇත්තේ 1850 න් පසුව ඇතිවූ කාර්මික විප්ලවය නිසාය. එහෙත් මෙම ජනගහනය කොපමණ කලක් ඉදිරියටත් නඩත්තු කිරීමට මේ මිහිතලයට හැකිද?

වත්මන් ශිෂ්ඨාචාරයේ පදනම වූ ඛනිජ තෙල් සම්පත් අවසන් වෙමින් තිබේ. 1980 න් පසු සෑම වර්ෂයක් පාසාම ලොව අළුතින් සොයාගත් ඛනිජ තෙල් නිධි ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් එම වසර තුළ දී මිනිසා විසින් භාවිතයට ගෙන ඇත. ඒ අනුව ලෝකයේ තෙල් සහ ස්වාභාවික වායු භාවිතයේ උපරිම අවස්ථාව 2010 පමණ වන විට උදාවේයයි විද්වතුන් අනාවැකි පළ කරති. අද තෙල් මිළ සීඝ්‍රයෙන් ඉහළ නඟිමින් පවතින්නේ එබැවිනි. මේ මහපොළොව මත වර්තමානයේ දී ජීවත් වන මිනිසුන්හට ඛනිජ තෙල් සහ ස්වාභාවික වායු වලින් තොර අනාගතයක් ගැන සිතීමට සිදුවී ඇත්තේ එබැවිනි.

විද්වතුන් විසින් කරනු ලැබ ඇති අධ්‍යයනයන්ට අනුව පෙනි යන්නේ 1980 න් පසුව මිනිසා විසින් කරන ක්‍රියාකාරකම් මිහිතලයට ඔරොත්තු නොදෙන බවය. ඒ අනුව දැනට මිනිසා විසින් පරිසරයට සිදු කරන හානිය නිසා යලි යථාතත්වයට පමුණුවා ලිය නොහැකි වෙනස්වීම් ගණනාවක් සොබාදහමේ සිදුවෙමින් තිබේ.

නිදසුනක් ලෙස අප ජීවත් වන මේ මිහිතලය උණුසුම්වීම දැක්විය හැක. ඒ අනුව පසුගිය දශකය, ලොව උණුසුම්ම දශකය බවට පත්විය. පසුගිය සියවස තුළ මිනිසා විසින් පොසිල ඉන්ධන පිලිස්සීම මගින්, මිහිතලයට දැරිය නොහැකි ප්‍රමාණයට කාබන් ඩයොක්සයිඩ් වායුව වායුගෝලයට මුදාහැර ඇත. එමනිසා වායුගෝලයේ කාබන්ඩයොක්සයිඩ් වැඩිවීමෙන් මිහිතලය උණුසුම්වේ. ඒ හේතු කොටගෙන ඇතිවන දේශගුණික විපර්යාසයන් බොහෝමයකි. මිහිතලය උණුසුම්වීම නිසා ධ්‍රැව වල අයිස් කඳු දියවීම, මුහුදේ ජලමට්ටම ඉහළ යාම, වාෂ්පීභවනය ඉහළයාම, නියඟය, වගාබිම් විනාශ වී යාම, දුර්භික්ෂය, පිරිසිදු වතුර හිඟය, වසංගත ඇතිවීම, ලැව්ගිනි ඇතිවීම, කුණාටු සහ සුළිසුළං ඇතිවීම, ගංවතුර ඇතිවීම, නායයෑම් ඇතිවීම ආදී මීට පෙර ස්වාභාවික යැයි හැඳින්වූ විපත් මිනිසා විසින්ම ඇති කළ විපත් ලෙස අප හමුවට පැමිණ ඇත. මෙම ස්වාභාවික ව්‍යසන වලින් ලෝකයේ ජීවත් වන අතිවිශාල මිනිසුන් ප්‍රමාණයක් විපතට පත් වීමට නියමිතය.

විද්වතුන්ගේ වාර්තාවට අනුව මිහිතලයේ උෂ්නත්වය සාමාන්‍ය අගයට වඩා සෙන්ටිග්‍රේඩ් අංශක 2 කින් ඉහල යාම දැන් නොවැලැක්විය හැක්කකි. ආක්ටික් මුහුදේ අයිස් කඳු සියල්ලක්ම 2013 ග්‍රීෂ්ම ඍතුව වන

විට සම්පූර්ණයෙන් ම දියවී යනු ඇත. දැනටමත් අපි ප්‍රමාද වැඩිය. ඒ අනුව ඉහත සඳහන් කළ විපත්තීන් රාශියක් සිදුවී විශාල වශයෙන් තුන්වන ලෝකයේ ජනතාව විපතට පත්වීම වලක්වාලිය නොහැක.

විද්‍යාඥයින්ගේ ඉල්ලීම වන්නේ උෂ්නත්වය ඉහළ යාම සෙන්ටිග්‍රේඩ් අංශක 2 ක නවතා ගැනීමට නම් අවම වශයෙන් 2050 වන විටවත් ලොව වසන මිනිසුන් විසින් වාර්ෂිකව පිටකරන කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය 1990 පිට කළ ප්‍රමාණයෙන් 50% ප්‍රමාණයකටවත් අඩු කළ යුතු බවයි. ඒ අනුව 2015 පමණ වන විට මිනිසුන් කාබන් ඩයොක්සයිඩ් වායුව වායුගෝලයට පිටකිරීමේ උපරිම අවස්ථාව පසුකළ යුතුය. මේ අනුව පෙනී යන්නේ 2015 වන විට කාබන් ඩයොක්සයිඩ් පිටකිරීමේ ප්‍රධානතම වගඋත්තරකරු වන ගල් අඟුරු භාවිතයේ උපරිම අවස්ථාව ද පසු කිරීමට සිදුවනු ඇති බවයි. ලෝකය කාබන් සයොක්සයිඩ් වායුව පිටකිරීම 50% ක සාමාන්‍යයකින් අඩු කිරීමට යාමේදී තම රටවල් වායු පිටකිරීම 80%කින් අඩු කිරීමට එකඟවන බව යුරෝපීය ප්‍රජාව පවසයි. එසේවුවද ඒ අනුව තුන්වන ලෝකය ද අඩුව පිරවීම සඳහා සිය වායු පිටකිරීම් 30% කින් අඩු කර ගත යුතුය.

කාර්මික රටවල ජීවත්වන මිනිසකු, සෙසු තුන්වන ලෝකයේ රටක ජීවත් වන මිනිසෙකු පිටකරන කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය මෙන් 20 ගුණයක් පමණ වසරකට පිටකරයි. මේ වනවිට සිදුවී ඇති විපර්යාසයන්ට අනුව පෙනියන්නේ දැනටමත් ලෝකයට ඔරොත්තු නොදෙන ප්‍රමාණයකට වායුගෝලය දූෂණය වී ඇති බවය. මෙහි සැබෑ තේරුම නම් දියුණු රටවල් විසින් දුප්පත් රටවල ජනතාවගේ කාබන්ඩයොක්සයිඩ් පිටකිරීමේ අයිතිවාසිකමද පැහැරගෙන ඇති බවය. ඒ අනුව දියුණු රටවල්, තුන්වන ලෝකයේ රටවලට පාරිසරික වශයෙන් ණය වී ඇති බව පැහැදිලිය. තුන්වන ලෝකය මූල්‍ය ණය බරින් මිරිකී සිටී. අනෙක් අතින් කාර්මික ලෝකය පාරිසරික ණය බරින් මිරිකී සිටී. එබැවින් ප්‍රශ්නයෙන් ගොඩ ඒමට නම් ණය එකිනෙක කපාහරින වැඩසටහනකට ලෝකය පැමිණිය යුතුය.

රජයන් අතර මේ පිළිබඳ වූ කඹ ඇදීම නිම කරන්නට මෙතෙක් නොහැකි වී ඇත. එහි අවසාන ප්‍රතිඵලය වන්නේ වෙන කිසිවක් නොව මිහිතලයේ උෂ්නත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 2කට වඩා එනම් සෙන්ටිග්‍රේඩ් අංශක 6-8 කින් ඉහළ යාමයි. මෙය අන් කිසිවක් නොව වර්තමාන මානව ශිෂ්ටාචාරයේ බිඳවැටීමයි. එනම් බිලියන ගණනින් මිනිසුන් මරුමුවට පත්වීමයි.

එමනිසා දැන් අපි වහා වහා ක්‍රියාත්මක විය යුතුය. සකල ලෝක වාසී ජනතාවට ඇත්තේ එකම එක විසඳුමකි. එනම් තම ජීවන රටාව වෙනස් කර ගැනීමයි. ජනතාව කාමසුඛල්ලිකානුයෝගයෙන් සහ අත්තකිලමතානුයෝගයෙන් මිදී මධ්‍යම ප්‍රතිපදාවට පැමිණිය යුතුය. සංවර්ධනය පිළිබඳ ව්‍යාජ මිනුම් දර්ශක වලින් මිදී නව මිනුම් දර්ශක සකසා ගත යුතුය. මේ සඳහා අවශ්‍ය දාර්ශනික පසුබිම සහ පැවතුම් රටා අපගේ මේ ශ්‍රී ලංකාවේ ඇත. එබැවින් එය අපට අපගේ නිවසින්ම ආරම්භ කළ හැක.

ශ්‍රී ලංකාවේ අප, ගල් අඟුරු බලාගාර ඉදිකර අපේ බලශක්ති අර්බුදය විසඳීමට සැලසුම් සකසා ඇත. ඒ වෙනුවට එම ප්‍රාග්ධනය, බලශක්ති සංරක්ෂණය සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව සඳහා ආයෝජනය කළ යුතුය. අපේ මහපොළවේ සහ අපේ මහමුහුදේ ඇති පුනර්ජනනීය බලශක්ති ප්‍රභව වලින් ප්‍රයෝජන ගැනීමට කඩිනම් පියවර ගැනීම අත්‍යාවශ්‍ය වේ. එමෙන්ම මිහිතලය උණුසුම්වීමේ ක්‍රියාවලියට හැඩගැසීමේ වැඩසටහන් වහ වහා සම්පාදනය කරගතයුතුය. මෙම අභියෝගයට මුහුණ දිය හැක්කේ මානව වර්ගයාට, මිහිතලයට, සතා සිව්පාවාට, සහ ගහකොළට ආදරය කරන ජනතාවකට පමණි.